සැ. යු. - මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,715 - 2011 ජූලි මස 15 වැනි සිකුරාදා - 2011.07.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1014 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1016 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජූලි මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජූලි මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## සංශෝධනය

2011.06.17 වැනි දිනැති *ගැසට් පත්‍රයේ* පළකරන ලද මධ්‍යම පළාත්සභා රාජ්‍ය සේවයේ වත්තේගම නගර සභාවේ ට්‍රැක්ටර් රියදුරු/මාර්ග කම්කරු (කොන්ත්‍රාත් පදනම) තනතුර සඳහා වන අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2011.07.25 වැනි දක්වා දීර්ඝ කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

ඩී.එම්. සී. අයි. දිසානායක,
ලේකම්,
වත්තේගම නගර සභාව,
වත්තේගම.

07-439

---

## ගල්ගමුව ප්‍රාදේශීය සභාව

වයඹ පළාත් රාජ්‍ය සේවයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර, අනියම්, තාවකාලික, ආදේශක, ස්වේච්ඡා සේවකයින් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.)

| | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | මාර්ග කම්කරු | 01 | PL-1-2006(IV)<br>රු. 11,730-10x120-10x130-10 x145-12x160-රු. 17,600 | අවම වශයෙන් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය. |

*(2) නියමිත තනතුරු සඳහා වෙනත් පොදු සුදුසුකම් :*

01. ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අවම වශයෙන් වසර 03ක ස්ථිර පදිංචියක් ඇත්තෙකු විය යුතුය.
02. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයින්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
03. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
04. අයදුම්කරුවන් යහපත් චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
05. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ පළාත් පාලන සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.

*(3) සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන බාහිර අයදුම්කරුවන් සඳහා වන ලකුණුදීමේ නිර්ණායකයන් -*

*01. මූලික අධ්‍යාපන සුදුසුකම් :*

| | | |
|---|---|---|
| 1-1 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සා. පෙළ සාමාන්‍ය සාමාර්ථයක් සඳහා ලකුණු | 03 |
| 1-2 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සා.පෙළ සම්මාන සාමාර්ථයක් සඳහා ලකුණු | 04 |
| 1-3 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සා.පෙළ විශිෂ්ඨ සාමාර්ථයක් සඳහා ලකුණු | 05 |

අ.පො.ස. සා.පෙළ විභාගයේ උපරිම වශයෙන් විෂයන් දෙකක් සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.

| | | |
|---|---|---|
| 01. | අධ්‍යාපන සුදුසුකම් සඳහා ලබා දිය හැකි උපරිම ලකුණු සංඛ්‍යාව | 30 |
| 02. | සාමාන්‍ය දැනීම හා අවබෝධය සඳහා ප්‍රශ්නාවලියක් මගින් තෝරාගත් ප්‍රශ්න 05කට දෙනු ලබන පිළිතුරු අනුව උපරිම ලකුණු | 50 |
| 03. | පෞරුෂය සඳහා ලකුණු | 20 |
| | මුළු ලකුණු | 100 |

*(4) බඳවාගැනීමේ ක්‍රමය හා අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

01. සේවා අවශ්‍යතාවයට අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරනු ලැබේ.
02. දැනටමත් මෙම සභාවේ අදාළ තනතුරුවල තාවකාලික/අනියම්/ආදේශක/දීමනා/ස්වේච්ඡා පදනම් මත සේවයේ නියුක්ත වූවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

03. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත් අනුව පිලියෙල කර ගන්න ලද අයදුම්පත් 2011.07.30 දිනට පෙර ලැබෙන සේ ලේකම්, ගල්ගමුව ප්‍රාදේශීය සභාව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(05) අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කර අයදුම්පත එවිය යුතුය.

(06) අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය ඃ

*(අ)* උප්පැන්න සහතිකය;
*(ආ)* අධ්‍යාපන සහතික;
*(ඇ)* පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය;
*(ඈ)* මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරින්ගෙන් ලබාගත් එකක් විය යුතුය);
*(ඉ)* වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතිකය.

(07) මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ අතරතුරදී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලතල ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

(08) අවම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් යථා කාලයේ දී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ගල්ගමුව ප්‍රාදේශීය සභාව.

2011 ජූලි මස 24 වැනි දින,

*ආදර්ශ අයදුම්පත්‍රය*

*ගල්ගමුව ප්‍රාදේශීය සභාව*

......................................... *තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. *(අ)* මුලකුරු සමග නම :———————.
02. *(ආ)* සම්පූර්ණ නම :———————.
03. ලිපිනය :———————.
04. උපන් දිනය:
අවුරුද්ද :———————. මාසය:———————. දිනය:———————.
05. ජාතික හැඳුනුම්පත් අංකය :———————.
06. ස්ත්‍රී/පුරුෂ භාවය : ———————.
07. විවාහක/අවිවාහක බව : ———————.
08. ජාතිය : ———————.
09. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද ? එසේ නම් පරම්පරාවෙන්ද ? ලියාපදිංචිවීමෙන් ද යන වග :———————.
10. අධ්‍යාපන සුදුසුකම් ඃ ———————.
11. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද : ———————.
12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ ආදේශක සේවය කරන්නේ නම් සේවා කාලය සහ විස්තර :———————.
එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/දීමනා පදනම ද යන වග)

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

———————,

අයදුම්කරුගේ අත්සන.

***දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය***
***(දැනට සේවයේ නියුක්ත වූවනට පමණි)***

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, තෝරාගනු ලැබුවහොත් සේවයේ මුදාහැරීමට එකඟ වන බවත්, දැනට ................................. වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

———————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය : ———————.

07-414

# පළාත් පාලන නිවේදන

## කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තියෙන් (1) වන උප වගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාරව කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව විසින් 2011 මැයි මස 24 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. පී. නීල් වීරසිංහ,
සභාපති,
කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව.

2011 ජුනි මස 01 වැනි දින,
කරුවලගස්වැව දී ය.

### *යෝජනාව*

*යෝජනා අංක : 16 (2) - සම්මත අතුරු ව්‍යවස්ථාව පිළිබඳ*

"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1)වන උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010.07.16 දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (අ) කොටසේ පළකරනු ලැබ වයඹ පළාතේ පළාත් සභාව විසින් ස්ථිර කරන ලද 2011.04.28 වැනි දින අංක 1703/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ IV (අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූ ද ප්‍රාදේශීය සභාවල අප්‍රසන්න, අන්තරාදායක සහ අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් කටයුතු, සංචාරක වෙළඳාම, ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම, ප්‍රාදේශීය සභා සීමාව තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම, ලැගුම් නිවාස හා නවාතැන් පලවල් පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

07-277

---

## අරණායක ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

මා විසින් 2010.12.31 වැනි දින අංක 1687, 2011.02.03 වැනි දින අංක 1692, දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ iv වැනි කොටසේ පල කරන ලද අරණායක ප්‍රාදේශීය සභාව සතු පාරවල් පිළිබඳ නිවේදනයේ සඳහන් පහත උපලේඛනයේ දැක්වෙන සියළුම පාරවල් අරණායක ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (3) (1) ඡේදය ප්‍රකාරව මෙයින් දැනුම් දෙමි.

ආර්. දිනේෂ් ගුණරත්න,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
අරණායක.

2011 ජුනි මස 16 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

1. මාර්ගයේ නම :- සෞඛ්‍ය මධ්‍යස්ථාන මාර්ගය
මාර්ගයේ ආරම්භය හා අවසානය :- ගල්අතර උස්සාපිටිය ප්‍රධාන මාර්ගයේ ලෙව්කේවත්ත නමැති ඉඩමෙන් ආරම්භව සෞඛ්‍ය මධ්‍යස්ථානය දක්වා
මාර්ගයේ දිග : අඩි 505 පළල : අඩි 10
ග්‍රාම නිලධාරි වසම : උස්සාපිටිය

2. මාර්ගයේ නම :- රහල කන්දෙදෙනිය සිට හපුගහමුල හේන දක්වා මාර්ගය
මාර්ගයේ ආරම්භය හා අවසානය : කන්දෙදෙනියේ සිට හපුගහමුලහේන දක්වා
මාර්ගයේ දිග : මීටර් 160 පළල : අඩි 08
ග්‍රාම නිලධාරි වසම : රහල වසම අංක 41/ඒ

3. මාර්ගයේ නම : ගනේකොටුව වත්ත පාර
මාර්ගයේ ආරම්භය හා අවසානය : වේරගොඩ ප්‍රාදේශීය සභා මාර්ගයේ සිට ලොට් අංක 09 දරන ඉඩම දක්වා
මාර්ගයේ දිග : මීටර් 640 පළල අඩි 14
ග්‍රාම නිලධාරි වසම : දිප්පිටිය

4. මාර්ගයේ නම : සැලව රජමහා විහාර මාවත
මාර්ගයේ ආරම්භය හා අවසානය : අරණායක හෙම්මාතගම ප්‍රධාන මාර්ගයේ කුඩා ඔය අසලින් ආරම්භව විහාරස්ථානය දක්වා
මාර්ගයේ දිග : අඩි 715 පළල අඩි 16
ග්‍රාම නිලධාරි වසම : අංක 41/ඒ සැලව නැගෙනහිර

5. මාර්ගයේ නම : නිකපිටිය දෙනාවත්ත මාර්ගය
මාර්ගයේ ආරම්භය හා අවසානය : පොල්අඹේගොඩ සිට වේරගොඩ මාර්ගයේ නිකපිටිය සණස අසලින් ආරම්භව නිකපිටිය ඔය අයින මාර්ගයට සම්බන්ධ වෙයි
ග්‍රාම නිලධාරි වසම : නිකපිටිය අංක 46
මාර්ගයේ දිග : මීටර් 250 පළල : අඩි 08

6. මාර්ගයේ නම : දෙබත්ගම වියන්එළිය සිට ශ්‍රී රතන ජෝත්‍යාරාමය විහාරය දක්වා මාර්ගය
මාර්ගයේ ආරම්භය හා අවසානය : දෙබත්ගම ප්‍රධාන මාර්ගයේ වියන්එළිය සිට විහාරස්ථානය දක්වා
ග්‍රාම නිලධාරි වසම : අංක 47බී, දෙබත්ගම උඩබාගේ
මාර්ගයේ දිග : මීටර් 60 පළල : අඩි 12

7. මාර්ගයේ නම දෙබත්ගම වත්තේගෙදර මාර්ගයේ මැකිනියගල දක්වා මාර්ගය
මාර්ගයේ ආරම්භය හා අවසානය : දෙබත්ගම ගලපිටතැන්න ඉඩමෙන් ආරම්භව හපුගහහේන ඉඩමෙන් අවසන් වෙයි
ග්‍රාම නිලධාරි වසම : අංක 47 බී, දෙබත්ගම
මාර්ගයේ දිග : මීටර් 540 පළල : අඩි 08

8. මාර්ගයේ නම : අම්බලකන්ද උයන්වත්ත හරහා ගල්ලෙනවත්ත මාර්ගය
මාර්ගයේ ආරම්භය හා අවසානය : අම්බලකන්ද සිට ගැටබේරිකන්ද මාර්ගයේ ඩබ්ලිව්. ගුණසේකර මහතාගේ නිවස අසල සිට උයවන්වත්ත මයාගේ නිවස දක්වා
ග්‍රාම නිලධාරි වසම : අංක 43 ඒ, අම්බලකන්ද
මාර්ගයේ දිග : මීටර් 469.50 පළල : අඩි 10

9. මාර්ගයේ නම : ඇපලාව වත්ත කඩේ ලග සිට ගල්අතර හිටිනාවත්ත මාර්ගය
මාර්ගයේ ආරම්භය හා අවසානය : ඇපලාව වත්ත කඩේ අසල සිට ගල්අතර හිටිනාවත්ත බෝගහමුලවත්ත හරහා ඇපලාව ලුහු ඉංජිනේරු ආයතනය දක්වා
ග්‍රාම නිලධාරි වසම : ඇපලාවත්ත, උඩුවේවල, ගල්අතර
මාර්ගයේ දිග : මීටර් 469.50 පළල : අඩි 10

07-297

**කොළඹ මහා නගර සභාව**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තිය සමග කියවිය යුතු 252 වන අධිකාරය වන 1947 අංක 29 දරන මහ නගර සභා ආඥා පනතේ 71(1) වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති පාර "රණවිරු රොෂාන් ප්‍රදීප් රුද්‍රිගු මාවත" යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. එම්. බී. ජයවර්ධන,
නාගරික කොමසාරිස්,
කොළඹ මහ නගර සභාව.

මහ නගර සභාව,
පුරහල,
කොළඹ 07.

*උපලේඛනය*

01. පළාත් පාලන ආයතනයේ නම : කොළඹ මහ නගර සභාව
02. දිස්ත්‍රික්කය : කොළඹ
03. වීථියේ වර්තමාන නම : නමක් යොදා නැත.
04. අලුතින් යොදා ඇති නම : රණවිරු රොෂාන් ප්‍රදීප් රුද්‍රිගු මාවත
05. මාර්ග විස්තරය : මෙම මාර්ගය ජයන්ත මල්ලිමාරච්චි මාවතේ වරිපනම් අංක 85 සහ 95 (බ්ලූමැන්ඩල් නාගරික කොට්ඨාසය) අතරින් ආරම්භව වරාය පිවිසුම් මාර්ගය අසලින් අවසන් වේ.

07-279

---

**බිංගිරිය ප්‍රාදේශීය සභාව**

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තියේ (I) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් 2011 මැයි මස 24 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. එම්. දිමුත් තුෂාර ඒකනායක,
සභාපති,
බිංගිරිය ප්‍රාදේශීය සභාව.

2011 ජුනි මස 01 වැනි දින,
බිංගිරිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලදුව 2010.07.16 දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරනු ලැබූ වයඹ පළාතේ පළාත් සභාව විසින් ස්ථිර කරන ලද 2011.04.28 අංක 1703/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූ ද ප්‍රාදේශීය සභාවල, අප්‍රසන්න, අන්තරාදායක, සහ අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් කටයුතු, සංචාරක වෙළඳාම, ප්‍රාදේශීය සභා සීමාව තුල වාහන නවතා තැබීම ප්‍රාදේශීය සභා සීමාව තුල මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම, ප්‍රාදේශීය සභා සීමාව තුල පාරවල් සහ මංමාවත් සැරසිලි කිරීම, ලැගුම් නිවාස හා නවාතැන්පොළවල පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ බිංගිරිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

07-340

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.